# ඇඳුන් සිහින

3



හේමමාලා හේරත් ලියන නවකතාව

රිදීමා සිතමින් උන්නේ, මහීකාට මොවුන් මුණගැසුණේ කවදා, කොහේදීදැයි කියාය. තරුණයන් දෙදෙනාගෙන් වඩාත් උස් වූ, හීන්දෑරි තරුණයාගේ මුහුණෙහි වූයේ සිනාසෙන්නටම උපන්නකුගේ ලීලාවකි. බැලූ බැල්මට අනෙක් තරුණයා ගැනුණේ, සුබරත්න මැණිකෙගේ භාෂාවෙන් කියනවා නම්, "රස්තියාදු කාරයින්ගේ " ගොඩටය. ඔහුගේ ඩෙනිම් කලිසම සේදීමෙන් ම සුදු පැහැ ගැන්ව තිබුණේය. අත්කොට කමිසය කොහේදෝ සිට සොයා ගත්තාක් බඳුව රැලි වැටී තිබිණි. දින කිහිපයකින් නොකැපූ රැවුළ, මුහුණට එක් කළේ මොස්තරයක් නොව හැඩිදැඩි පෙනුමකි. ජලාශය සලිත කරමින් ආ සුළඟ ඔහුගේ කෙහෙ රැලි අවුල් කළේය. තියුණු දෑසින් මහීකා දෙස බලා ගත් ගමන් උන් ඔහු, කීවේ මො-නවාදැයි රිදීමාට තේරුම් ගියේ නැත.

"රිදීමා ! මේ අජය..... මම ඔයාට කලින් කිව්වේ..." මහීකා 'අජය' යන නම මීට කලින් සඳහන් කළා යැයි ඇයට මතකයක් නොතිබුණේය.

"මම දිනූෂ....." අනෙක් තරුණයා හිනැහුණේය. "මෙයා යන්නෙම කාත් එක්ක හරි ගහගන්න. මමත් ඉතින් පස්සෙන් යනවා බේත් දාන්න...."

අජය තම යහළුවා දෙස රවා බැලුවේය. දිනූෂ තම දෙඅත් පෙරට දිගු කළේ පහරක් වළකන්නට තනන්නාක් මෙනි.

"ගහන්න නම් එපා....." ඔහු පවසන විට මහීකා හඬනගා හිනැහුණාය. රිදීමාගේ මුවගටද නැගුණේ මඳ සිනහවකි. ඔවුන් වෛද්‍ය ශිෂ්‍යයන් බවත් දිනූෂ ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකිකයෙකු බවත්, අජයගේ දෙමව්පියන් හා සොහොයුරා ශ්‍රී ලංකාවෙහි ජීවත්වන බවත්, ඔවුන්ගේ කථාවට සවන් දුන් ඈ දැනගත්තාය.

"අපි ඕනෑම උදව්වක් කරනවා. කිසිම ප්‍රශ්ණයක් නෑ....." කීවේ අජයයි. "ඒත් මට තෙරෙන්නේ නැහැ රිදීමා ඒ පස්සේ ඔච්චර දුවන්නෙ ඇයි කියලා !" ඔහු ප්‍රශ්ණය යොමු කළේ මහීකා වෙතය. මහීකා තම කථාව ඔවුන් හා පවසනු රිදීමා බලා සිටියාය. අජය සිත්ගන්නා සුළු තරුණයෙකු බව ඔහු දෙස බලා සිටි ඇයට මොහොතකට සිතුණේය.

"කථාව නම් හරිම රසවත් !" මහීකාගේ කථාව අවසානයේ දිනූෂ පැවසීය.

"හැබැයි මට කිසිම දෙයක් තේරුණේ නම් නැහැ......"

"මම නම් කියන්නේ රිදීමාට එයාගේ යටගියාව අමතක වෙන්න මොකක් හරි බරපතළ සිදුවීමක් වෙලා ඇති කියලයි....." අජය පැවසුවේය.

"එතනට යන්න රිදීමාගේ හිත දෙන්නේ නැහැ. එතන තමයි ප්‍රශ්ණේ. ඒක නිරාකරණය කරගත්ත හැටියේ ප්‍රශ්ණය ඉවරයි......"

ඉන්පසු ඔවුහු තවත් මොනවදෝ කථා කළෝය. ඇය ඔවුන්ගේ දෙබසට සවන් දුන්නේ අතරින් පතරය.

"මට සල්ලි නැ. මම ඉන්නේ අය්යත්, තාත්තත් අමාරුවෙන් එවන සල්ලිවලින්. සමහර වෙලාවට මට කන්න සල්ලි නෑ. පෙට්‍රල් ගහන්න සල්ලි නෑ. මම වැටිලා ඉන්නේ දුරින් නෑ වෙන අන්කල් කෙනෙක් ළඟ. මිනිහා මට එයාගෙ ගෙදර නිකං වැටිලා ඉන්න ඉඩ දීලා තියෙනවා....." අජය කියමින් උන්නේය.

"මම පුංචි පාර්ට් ටයිම් ජොබ් එකකුත් කරනවා. මේ දිනූෂට නම් ඕනෑ තරම් සල්ලි... මම ලෝන් ගහන්නෙ මිනිහගෙන් !" දිනූෂ හඬනගා හිනැහුණේය. "මිනිහට ලෝන් ගහන්න ඕනැ උණාම, මාව ඔය විදියට මුරුංගා අත්තේ තියනවා....." සල්ලි තිබුණා යැයි කීවාට, ඔහුගේ පෙනු-මෙහි වූයේ, හරියට කෑම නොගන්නා අයෙකුගේ ස්වරූපයකැයි රිදීමා සිතුවාය.

"මූ බඩ පැලෙන්න තුන් වේලම බත් කනවා. ඒ උණාට හැමදාම මෙහෙමයි..."

ඇගේ සිත දුටුවාක් මෙන්, අජය පැවසුවේය. ඔවුන් හිඳ සිටියේ විශ්ව විද්‍යාල භූමිය තුළ, කුඩා ජලාශයක් අසලවූ පිට්ටනියේය. ලා තණ ගොල්ලේ හිඳ සිටීමෙන් රිදීමාට දැනුණේ සහනයකි. දහවල් ආහාරය සඳහා කැන්ටිම බලා යනතුරු, ඔවුහු කථා කළෝය. "ඒ දෙන්නා හරී හොඳයි...." මහීකා පසුව පැවසුවාය.

"මොනෑෂ් මෙඩිකල් සෙන්ටර් ගිය වෙලාවේ මට දෙන්නා හම්බ උණේ ! ඔයාගේ අර 'භූතයා' කවුද කියලා හොයාගන්න ඒ දෙන්නා උදව් කරන්නම් කීවා.... අජය නම් කියන දේ කරන කෙනෙක් වගේ පේනෙන්නෙ...." ඇගේ දෑස සුන්දර සිහිනයකින් පිරී යනු රිදීමා දුටුවාය.

"එයා ලස්සනයි නේද ?" මහීකා ඇසුවාය. "හ්ම්....." රිදීමා පිළිතුරු දුන්නාය.

"කියන්න තරම් වරදක් නෑ, රැවුල කපලා හොඳ ඇඳුමක් ඇන්දුවනම්......."

යෙහෙළියෝ හඬ නගා සිනාසුණෝය.

★★★★★★★★★★★★★★★★

***<u>මෝහනය වෙන අවස්ථාවේදී, තමාගේ මුහුණෙහි මතුවන සෑම ඉරියව්වක්ම මතක තබා ගන්නැයි රිදීමා, මහීකාට කලින් කියා තිබුණි.</u>***

සති අන්තය පැමිණියේ රිදීමා සිතුවාටත් කලිනි. ඉක්මනින් සති අන්තය එනතුරු බලා සිටියද, එය ඉක්මන් නොවූවා නම් මැනවැයි ඇයට සිතුණේය. අනෙක් අතට ඉක්මනින් යමක් පැමිණෙන්නේ , ඉක්මන් අවසානයක් ඇතිව නොවේදැයි ඈ කල්පනා කළාය. ඇයට මෝහනය කිරීම සූදානම් කර තිබුණේ, සෙනසුරාදා සවස හයටය. උදෑසන සිට ඇගේ යෙහෙළියෝ එදිනට අවශ්‍ය කාර්යයන් සියල්ල කලින් නිම කිරීමට වෙහෙසුණාහ.

මහීකා කලින් උයා පිහා, නිම කළාය. ටෙලිෆෝනය ගැලවුණේය. අනවශ්‍ය දුරකතන ඇමතුම්වලින් බාධා පැමිණෙතැයි කියාය. අමාගේ කාමරය, මෙම කාර්යය සඳහා මැනවැයි නිගමනය කෙරිණි. රිදීමාට එදින නිවාඩු ලැබුණේය. ඇයට වූයේ විවේකී සුවයෙන් සිටීමටය. එහෙත් වෙලාව ළංවෙද්දී, ඇගේ හද ගැහුණේය. සියල්ලෝම ඉඟුරු දැමූ තේ පානය කළාහ.

"මට දැනෙන්නේ පුංචි කාලෙදි වගේ මොක-ක් හරි 'හොර වැඩක්' කරන්න ලෑස්තිවෙනවා වගේ" රුචිරා හිස් කළ තේ කෝප්පය, පසෙක තබමින් පැවසුවාය.

රිදීමා හිනැහුණාය. සිතේ ගුලිවී තිබූ යමක් දියව ගියාක් මෙන් සහනයක් ඇයට දැණුනේය.

"අපි දැන් කරන්න හදන්නෙ ඒ වගේ දෙයක්ම තමයි..... මේකත් හොරම හොර වැඩක්. කවුරුත්ම දන්නෙ නැහැ අපි ටික ඇර........" අමා පැවසුවාය.

යෙහෙළියෝ ඇගේ කාමරයට එකතු වූහ. කවුළු තිර වැසිණි. මහීකා ඉටිපන්දම් කිහිපයක් දල්වා, විදුලි පහන් නිවා දැම්මාය.

"දැන් තමා ගතියක් ආවේ......" ඒ රුචිරාය. රිදීමා සෙමෙන් යහන මත දිග ඇදුණාය. තුනී සළුවකින් ගතද වසා ගත්තාය.

"මෙයා සනීපෙට නිදයිද දන්නෙත් නෑ......" අමා පැවසුවේ, සියල්ලන්ව සිනස්සවමිනි. යෙහෙළියෝ ඇඳ වටා පුටු කිහිපයක් තබා හිඳ ගත්තාහ. මෝහනය වෙන අවස්ථාවේදී, තමාගේ මුහුණෙහි මතුවන සෑම ඉරියව්වක්ම මතක තබා ගන්නැයි රිදීමා, මහීකාට කලින් කියා තිබුණි.

"මම පටන් ගන්නද ?" අමා සෙමින් ඇසුවාය. රිදීමා කළේ හිස සෙලවීම පමණෙකි. ඈ ඇස් පියාගත්තාය.

පරිසරය නිසලව ගියේය. කොහේදෝ යන රථයක හඬක් ඈතින් ඇසිණි. ගසක අත්තක තනිව හිඳිනා කුරුල්ලෙකුගේ ගී නාදයක් රිදීමාට ඇසුණේය.

"රිදීමා....... මම මුලින්ම ඔයාව 'රිලැක්ස්' කරවනවා. ඊට පස්සේ දහයට ගණිනවා. ඔයාව මෝහනයෙන් එළියට ගන්න ඒ ක්‍රියාවලියේම මම ආපස්සට යනවා. ඔයා මොනවා දැක්කත්, මොනවා කළත්, මම ඔයා එක්ක, ඔයා ළඟින්ම ඉන්නවා. ඔයාට මගේ කටහඬ දුරකින් වගේ ඇහෙයි...... ඒ හඬට ඔයා අවධානය යොමු කරන්න......."

අමා, තමාගේ සුරත සෙමෙන් මිරිකා අතහරිනු රිදීමාට දැණුනේය. අන් සියල්ලන් හුස්ම ගන්නා හඬ පවා තමාට ඇසෙන්නේ යැයි ඈ සිතුවාය. ඇය දෙනෙත් තරකොට පියා ගත්තේ, සියල්ල අත්හළ අයෙකු මෙනි.

"ඔයාගේ නළලේ හරි මැදට අවධානය යොමු කරන්න........" අමා විධානය කළේ, රිදීමාගේ ගතෙහි හිරිගඩු නංවමිනි. ඒ ඇගේ යෙහෙළිය අමාගේ හඬ නොවේ. පළපුරුදු වෛද්‍යවරියකගේ හඬකි.

"ඔයාගේ ඔළුවේ බර ගතියක්, තද ගතියක් දැනෙනවා ඇති. ඒ සියල්ල අයින් කරලා රිලැක්ස් වෙන්න. ඔන්න දැන් ඔයාගේ හිසේ බර ගතිය නැති වෙනවා. තද ගතිය

